# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2092/69 - 2018 ඔක්තෝබර් මස 13 වැනි සෙනසුරාදා - 2018.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර :*

ගාල්ල දිස්ත්‍රික්කයේ ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝනාපීනුවල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද මූ,පී.ගා. 4336 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 ලෙස සඳහන් හෙක්ටයාර 0.0010(අක්.0/රූ.0/පර්.0.3955) ක් වූ බටදොඹගහවත්ත නැමැති ඉඩම :-

උතුරට: මාර්ග (මා.සං.අ.) සහ ගා. 3857 මූලික පිඹුරේ කැබලි අංක 57; නැගෙනහිරට: ගා. 3857 මූලික පිඹුරේ කැබලි අංක 57 සහ පී.ඩී.ආර්. දේවසිරි සහ ජේ.ඒ. විජේවික්‍රම හිමිකම් කියන බටදොඹගහවත්ත; දකුණට: ජේ.ඒ. විජේවික්‍රම හිමිකම් කියන බටදොඹගහවත්ත, විමල් තිලක පින්නදූව හිමිකම් කියන බටපොලගෙවත්ත සහ ගා. 3857 මූලික පිඹුරේ කැබලි අංක 58; බටහිරට: ගා. 3857 මූලික පිඹුරේ කැබලි අංක 58 සහ මාර්ග (මා.සං.අ.);

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018 දෙසැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10.00 ට ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2018 දෙසැම්බර් මස 26 වැනි දිනට මත්තෙන් ඒ *ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

එල්. එන්. පියුමලි ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
ගෝනාපීනුවල.

2018 සැප්තැම්බර් මස 28 වැනි දින,
ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

10-1504


1A - G 28728 - 27 (2018/10)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* MUL/LND/02/ACQ/42
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4/3/15/2014/වීර්/48

2018 ජූලි මස 02 වැනි දින අංක 2078/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* තෙවැනි කොටසේ 7 වැනි වගන්තිය යටතේ මුලටියන ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති 2018 සැප්තැම්බර් මස 12 වැනි දින පෙරවරු 10.00ට යන්න **2018 දෙසැම්බර් මස 12 වැනි දින පෙරවරු 10.00ට** යනුවෙන්ද 2018 සැප්තැම්බර් මස 10 යන්න **2018 දෙසැම්බර් මස 05** යනුවෙන් සංශෝධනය කල බව මෙයින් දැනුම් දෙමි. වැඩි විස්තර 2018.07.02 වැනි දින අංක 2078/9 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් වේ.

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2018 ඔක්තෝබර් මස 10 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

10-1505

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.